# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 2171635 - 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1747/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 23/11/2024 පැය 1600

## මාධ්‍ය නිවේදනය

**01. බදුල්ල පොලිස් වසමේ 2024.11.01 වන දින සිදු වූ කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සිසුන් ගමන්ගත් බස් රථය අනතුරට ලක් වීම සම්බන්ධව - බදුල්ල පොලිස් වසම.**

2024.11.01 වන දින බදුල්ල පොලිස් වසමේ දී කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සිසුන් හා ආචාර්යවරුන් ගමන් ගත් බස් රථය අනතුරට ලක් වීමෙන් එහි ගමන්ගත් ශිෂ්‍යාවන් දෙදෙනෙක් මිය ගොස් 39 දෙනෙකු තුවාල ලබන ලදී.

එම අනතුරින් බරපතල තත්වයේ සිටි සිව් දෙනෙකු වැඩිදුර ප්‍රතිකාර සඳහා 2024.11.13 වන දින බදුල්ල මහ රෝහලේ සිට වේරහැර ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට අනුබද්ධ රෝහල වෙත මාරුකර යවා තිබිණි. එහි ප්‍රතිකාර ලබමින් සිටි **වයස අවුරුදු 24 ක් වූ යාපනය ප්‍රදේශයේ පදිංචි ශිෂ්‍යයෙකු 2024.11.23 වන අද දින අළුයම් කාලයේදී මිය ගොස් ඇත.**

මෙම අනතුර සම්බන්ධයෙන් බදුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - වැල්ලම්පිටිය පොලිස් වසම.**

2024.11.22 වන දින උදෑසන කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ මීතොටමුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය අසල ත්‍රීරෝද රථයක රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව ඉදිරියෙන් පැමිණි කැබ් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රිරෝද රථ රියදුරු බරපතල තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ පිච්චමල්වත්ත, මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, කැබ් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - සීදූව පොලිස් වසම.

2024.11.23 වන දින අළුයම් කාලයේ සීදූව පොලිස් වසමේ කොළඹ මීගමුව මාර්ගයේ අම්බලන්මුල්ල ප්‍රදේශයේදී කොළඹ දෙස සිට මීගමුව දෙසට ධාවනය වූ ලොරි රථයක් එම දෙසටම මාර්ගය අයිනෙන් ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. බරපතල තුවාල ලැබූ පදික කාන්තාව සීදූව විජයකුමාරතුංග රෝහලට ඇතුලත් කරනවිටත් මියගොස් සිට ඇත.

**මරණකාරිය වයස අවුරුදු 58 ක් වූ සීදූව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. සීදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**